# 2012 – 12 – 10 වන දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පැවති විශේෂ සභා රැස්වීම් වාර්තාව

සහභාගීත්වය :-

| | | |
|---|---|---|
| **01.** | එම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා | ගරු සභාපති |
| 02. | කමල් වැල්ලගේ මහතා | ගරු උප සභාපති |
| **03.** | ඒ. ජී. ලක්ෂ්මී හේමන්තා සිල්වා මෙනවිය | ගරු නගර සභා මන්ත්‍රී |
| **04.** | එච්. එල්. අනුර කිත්සිරි මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| 05. | ජී. සරත් ශ්‍රීලාල් මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| **06.** | ග්‍රේෂන් කෙරම්ණියගේ මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| **07.** | ඒ. ඩබ්. ජගත් කුමාර මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| **08.** | ජේ. ඩබ්. ජයන්ත මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| **09.** | ආර්. ජී. දේව් රොහාන් ද සිල්වා මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| **10.** | කේ. එම්. චන්ද්‍රසිරි මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| **11.** | බී. ජනිත් වික්‍රමතිලක මහතා | ගරු නගර සභා මන්ත්‍රී |

☸ පන්සිල් සමාදන් වීමෙන් අනතුරුව පෙ. ව. **9.30** ට රැස්වීමේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී. ☸

**1. 2014 අය වැය සභා සම්මත කිරීම හා සිව් අවුරුදු සැළැස්ම අනුමත කිරීම**

2014 අය වැය පිලිගත යුතු බවට ගරු සභාපති එම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදී.

- පෙ. ව. 9.50 ට පමණ ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා සභා ගර්භයට පැමිණෙන ලදී
- පෙ. ව. 9.50 ට පමණ ගරු නගර සභා මන්ත්‍රී ඒ. ජී. ලක්ෂ්මී හේමන්තා ද සිල්වා මෙනවිය සභා ගර්භයට පැමිණෙන ලදී

**<u>ගරු සභාපති එම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,</u>**

2014 වර්ෂය සඳහා අය වැය ඉදිරිපත් කිරීමට ලැබීම සම්බන්ධව මම සතුටට පත් වෙනවා. මෙවර අයවැයේ ප්‍රධාන වශයෙන් විශේෂ වූ කරුණු රාශියක් අන්තර්ගත වෙනවා. ඊට ප්‍රධාන හේතු වශයෙන් මා දකින්නෙ මෙවර අය වැය නගර සභාවෙ මන්ත්‍රිවරුන් දෙළොස්දෙනාගෙ හෝ නගර සභාවේ ගණකාධිකාරීතුමාගේ සහ නිලධාරීන්ගේ අය වැයක් නොව සමස්ථ නගරයේ ජනතාවගේම අය වැයක් ලෙස මෙය හඳුන්වන්න පුලුවන්. මෙවර අපි අය වැය මූලික සිද්ධාන්ත සෑදීමේදී ප්‍රධානම කාර්ය ලෙස කරෙ සෑම ග්‍රාම සේවක කොට්ඨාශයකම රැස්වීමක් තියල අදහස් ලබා ගත්ත එක. සෑම ග්‍රාම සේවක කොට්ඨාශයකම ප්‍රසිද්ධ දැන්වීම් 80 ක් අලවල තියෙනවා. එම පෝස්ටර් මගින් සියලුම ජනතාවට මෙම අයවැය සකස් කිරීම සඳහා දායක වීමට අවස්ථාව ලැබුනා. මේ සඳහා අපේ නිලධාරීන් සෑහෙන මහන්සියක් දැරුවා. මේ කාර්ය කරෙ සෙනසුරාදා සහ ඉරිදා දිනවල. එහිදී ප්‍රජා සංවර්ධන නිලධාරී ඇතුලු සෑම ග්‍රාමසේවා කොට්ඨාශයක් සඳහාම එක් එක් නිලධාරියා බැගින් පත් කරා. ලිපි 100 ක් වගේ ප්‍රමාණයක් එක් එක් ග්‍රාම සේවා වසම් සඳහා බෙදා හැරියා. ඒ අනුව පක්ෂ විපක්ෂ භේදයකින් තොරව ගම්වැසියන් පැමිණිලා තමන්ගේ නගරය 2014 වසරේ කුමන ආකාරයකින් සකස් විය යුතුද කියන ආකාරය එම වැසියන් විසින් ලබා දුන්නා. මෙම සිවු අවුරුද් සැළැස්මේ යෝජනා කර ඇති සියලුම වැඩ සටහන් ජනතාව විසින් ඉදිරිපත් කරන ලද වැඩසටහන්. මෙහිදී අප සෑම කටයුත්තක්ම සිදු කරනු ලැබුවේ අදාල ප්‍රදේශයේ මන්ත්‍රීවරයාගේ මූලසුන ඇතිවයි. විපක්ෂ මන්ත්‍රීවරයෙක් හිටියත් එතුමා මූලසුනේ තියල තමයි ඒ අදහස් යෝජනා ජනතාවගෙන් ලබා ගත්තෙ. නගර සභාව මගින් සංවර්ධන උපදේශක කාරක සභාව නමින් උපදේශක සභාවක් අපි පත් කරා. මෙම සිව් අවුරුදු සැළැස්මත් මෙම අයවැය සම්බන්ධයෙන් බොහොම සුවිශේෂීව විශ්ලේෂණය කරල මේ සම්බන්ධයෙන් නගරයේ විශේෂඥ දැනුමක් ඇති අයගෙන් විමසීමක් කරල ඒ අයගෙ අදහස් අරගෙන අපි මේක සංශෝධනය කරා. ඒ අනුව සංශෝධනය කරපු එක ආයෙත් කොටුම්පතක් වශයෙන් නාගරික මන්ත්‍රීවරු ඒවගේම අපේ සියලුම ආයතන නිලධාරීන් එකතු වෙලා නැවත වාරයක් සාකච්ඡා කරා මේ අයවැය සම්බන්ධයෙන් ලබන 2014 වර්ෂයේ අපි කල යුතු විශේෂ කාර්යන් පිළිබඳව. ඒ අනුව නාගරික මන්ත්‍රීවරුන්ගෙ යෝජනාත් ඒ අනුව නැවතත් එතෙන්දි එකතු වුනා. ඊට පසුව අපි සංවර්ධන උපදේශක සභාවෙ අනුමැතියත් අරගෙන තමයි මේ අයවැය හදල තියෙන්නෙ. මම හිතනව මම 1997 සිට 2002 දක්වාත් ඒවගේම 2006 සිට අද දක්වාත් මම අයවැය ඉදිරිපත් කරල තියෙනවා. අද දින ඉදිරිපත් කරන අයවැය තරම් ජනතාවත් සමග ගැටිල ඉදිරිපත් කරේ නැහැ. වරදක් තියෙනව නම් සංශෝධනය කිරීම සඳහා නාගරික මන්ත්‍රීවරුන්ට කම්ටු නියෝජිතයන්ට ගමේ ඉන්න සාමාන්‍ය පුද්ගලයාට පවා හැකියාව තිබුණා. ඇත්තටම මම සතුටු වෙනවා යම් පරිශ්‍රමයක් යොදල තමයි මේක හදල තියෙන්නෙ. මෙහිදී සෑහෙන මහන්සියක් ගනු ලැබුව ගණකාධිකාරීතුමා, පොත් තබන නිලධාරිණිය සුවිශාල කැපකිරීමක් කරා. ඒ සම්බන්ධයෙන් මගේත් සියලුම මන්ත්‍රීවරුන්ගේත් නගරවාසීන්ගෙත් ස්තුතිය පුද කරනවා. ප්‍රධාන කළමනාකරණ සහකාර මහත්මිය මේ වෙහෙස මහන්සි වී වැඩ කරපු සියලු දෙනාට ප්‍රශංසනාත්මක ලිපි නිකුත් කරන්න.

මෙම අයවැය  සම්බන්ධයෙන් කරුනු  කතා කිරීමට පෙර 2013 වසර දිහා හැරී බලන විට අපි ප්‍රථමයෙන්ම ස්තුතිවන්ත වෙනවා අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාට. එතුමා විසින් ඉදිරිපත් කරන ලද මග නැගුම වැඩසටහන ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ බැසිල් රාජපක්ෂ අමාත්‍යතුමාගේ මග පෙන්වීම අනුව අපට යෝජනා 16 ක් අනුමත වුනා. අපට කරන්න හැකි වෙලා තියෙන්නෙ 9 ක් පමණයි. ඒ නමය සඳහා ඇස්තමේන්තුගත මුදල 10339171.17 ක් වෙනවා. වියදම් වශයෙන් සඳහන් වෙන්නෙ 4339085.89 ක මුදලක්. මෙම මුදල් ලබා දීම සම්බන්ධයෙන් නගර වැසියන් වශයෙන් මම ස්තුතිවන්ත වෙනවා. මම ඉතාමත්ම සතුටු වෙනවා ලබන වසර සඳහා මෙවැනි මාර්ග 50 ක් යෝජනා වී තිබෙනවා. පක්ෂ විපක්ෂ භේදයකින් තොරව එක් මන්ත්‍රීවරයෙකුට මාර්ග 4 ක් වෙනවා. ඒ අනුව ලබන වසර සඳහාත් ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය හරහා විශාල මුදල් ප්‍රමාණයක් මේ නගරයට ලැබෙනවා. මම මේ අවස්ථාවේදී අතිගරු ජනාධිපතිතුමා  ගරු බැසිල් රාජපක්ෂ අමාත්‍යතුමා ප්‍රමුඛ වත්මන් රජයට ස්තුතිවන්ත වෙනවා. ඒවගේම මෙම කාර්යන් කිරීමේදි දකුණු පළාත් සභාවෙත් සුවිශේෂ සහයෝගයක් ලැබුන පළාත් නිශ්චිත වශයෙන් වශයෙන් ලක්ෂ 13 ක මුදලක් ලැබිල තියෙනවා. ඒ සම්බන්ධයෙනුත් මේ අවස්ථාවේ මම ස්තුතිය පිරිනමනවා. මෙතන සඳහන් නැති දෙයක් තියෙනවා. පොල්වත්තෙ ඉදිකරනු ලබන ශරීර සුවතා මංතීරුව පිලිබඳව. ඒ සඳහාත් අපට මුදල් ලබා දුන්නෙ දකුණු පළාත් සභාවෙන් ගරු ප්‍රධාන අමාත්‍ය ෂාන් විජයලලාල් ද සිල්වා මැතිතුමා. එතුමා ලක්ෂ 30 ක මුදලක් ලබා දීල තියෙනවා පළවෙනි අදියර සඳහා. එය අදියරෙන් අදියර කරනු ලබන්නෙ. මේ සම්බන්ධයෙන් මම නැවත වතාවක් එතුමාට ස්තුතිය පුද කර

සිටිනවා. ඒවගේම අපගේ පුස්තකාලය සඳහා නියෝජ්‍ය කථානායක චන්දිම වීරක්කොඩි මහතා විසින් රු. 50000/- ක මුදලක් ලබා දීල තියෙනවා. ඒ සම්බන්ධයෙන් මම එතුමාට ස්තුතිවන්ත වෙනවා. ඒවගේම අනුර කිත්සිරි මන්ත්‍රීතුමාටත් ස්තුතිවන්ත වෙනවා එතුමාගේ මෙහෙයවීම අනුව තමයි මෙම මුදල ලබා දුන්නෙ. නගර සභා ප්‍රතිපාදන තුල අපි පසුගිය වසර තුල අවසන් කරන ලද කර්මාන්ත වල ඇස්තමේන්තුව 16924741.42 ක් වෙනවා. සත්‍ය වියදම වන්නෙ 11716327.17 ක මුදලක් අපි නගර සභා ප්‍රතිපාදන වලින් කර්මාන්ත සඳහා වියදම් කරල තියෙනවා. නගරයේ ජනතාවට මේ සම්බන්ධයෙන් සතුටු වෙන්න පුලුවන්. හිරේවත්ත බුදු පිළිමය අසල භූමිය නවීකරණය කිරිම සඳහා 524572.32 ක මුදලක් ද තල්ගස්පගොඩ බැද්ද ඉඩම ක්‍රීඩා පිටිය සඳහා සමතලා කිරිම සඳහා 1165462.70 ක මුදලක්ද දරල තියෙනවා. මෙහිදී මම ස්තුතිවන්ත වෙන්න ඕනෙ මේකෙ ඇස්තමේනතුව වෙලා තිබුණෙ ලක්‍ෂ විස්සකට අධික මුදලක් නමුත් අපේ උප සභාපති කමල් වැල්ලගේ මහතා මැදිහත් වෙලා එතුමාගේ සමිතියක් මගින් මෙම මුදලින් අර්ධයකට මෙම කටයුත්ත කලා. එහිදී ඔවුන් කිසිම ලාභයක් ලැබුවෙ නැහැ. මෙහි ප්‍රතිලාභ තමන්ගෙ ප්‍රදේශයේ ජනතාවට ඉටු විය යුතු නිසා එතුමා එම මුදලින් අර්ධයකින් ඉටු කර තිබුනා. ඒ සම්බන්ධයෙන් මම විශේෂයෙන්ම ස්තුතිවන්ත වෙනවා. කළුවඩුමුල්ල ශ්‍රී විජය නිවස ඉදිරිපිට සපත්තු කාණුව කොන්ක්‍රිට් කිරිම සඳහා 45357.88 ක මුදලකුත් විද්‍යුත් පුස්තකාල ගොඩනැගිල්ලක් (ප්‍රධාන පුස්තකාලයට යාබදව) ඉදිකිරිම සඳහා 901472.81 ක මුදලකුත් ඕකන්ද පෙර පාසල හා පුස්තකාල ගොඩනැගිල්ලේ සිවිලිම සවි කිරිම 551793.21 ක මුදලකුත් පොල්වත්ත පෙර පාසල් ගොඩනැගිල්ල අලුත් වැඩියා කිරිම සඳහා 314355.62 ක මුදලකුත් කෙරමිණිය දෙවන හරස් පාර කොන්ක්‍රිට් කිරිම 270038.33 ක වියදමකුත් කෙරමිණිය පොකුණ පාර කාණුවේ කොටසක් කොන්ක්‍රිට් කිරිම 254268.30 ක මුදලකුත් පොල්වත්ත වරිපනම් අංක 233/01 - 233/02 දරන නිවාසවලට ප්‍රවේශ මාර්ගය කොන්ක්‍රිට් කිරිම. (පොල්වත්ත රෝහල අසලින් යන අතුරු මාර්ගය) සඳහා 282029.37 ක මුදලකුත් පෝරඹ දේවාල පාර අතුරු මාර්ගය කොන්ක්‍රීට් කිරීම සඳහා 459275.49 ක මුදලකුත් සිරි නිකේතනාරාම පාර පැතිබැම්ම සඳහා 573398.67 ක මුදලකුත් තල්ගස්ගොඩ පෙර පාසල් ගොඩනැගිල්ල අළුත්වැඩියා කිරීම සඳහා 379028.42 ක මුදලකුත් කෙරමිණිය පොකුණ පාර අතුරු මාර්ගය කොන්ක්‍රිට් කිරීම සඳහා 173289.01 ක මුදලකුත් ගාලු පාර දොලොස් මහේ සේල් පොල අසල පොදු නාන ළිඳ අළුත්වැඩියා කිරිම සඳහා 175085.98 ක මුදලකුත් වැය කරල තියෙනවා. මෙහිදී අපි මතක් කරන්න මේ වසරේදි අපි අතහැර දමා තිබූ ළිං කිහිපයක්ම අලුත්වැඩියා කරා. විලේගොඩ වරි. අංක 2/30 අසලින් යන හරස් පාර හා කාණුව කොන්ක්‍රිට් කිරිම සඳහා 440296.95 ක මුදලකුත් හිරේවත්ත නාන තොටුපල අසල පිහිනුම් ක්‍රීඩකයන් සඳහා ඇඳුම් මාරු කිරීමේ කාමරයක් ඉදිකිරිම සඳහා 1130529.51 ක මුදලකුත් හෙප්පුමුල්ල පෙර පාසල් හා පුස්තකාල ගොඩනැගිල්ලේ සිවිලිම සවිකිරීම වෙනුවෙන් 344204.75 ක මුදලකුත් හල්වතුර නිවාස යෝජනා ක්‍රමයේ වරිපනම් අංක 73 - 45 නිවස ආරම්භයේ සිට අවසානය දක්වා මාර්ගය සංවර්ධනය කිරීම සඳහා 697982.47 ක මුදලකුත් ධම්මකුසල මාවත දෙපස කාණු පද්ධතිය කොන්ක්‍රිට් කිරීම සඳහා 443898.43 ක මුදලකුත් කැටන්තොට පෙර පාසල වටා ආරක්ෂිත වැටක් ඉදිකිරිම සඳහා 163669.89 ක මුදලකුත් පින්නදූව දෙවන හරස් පාර පැතිබැම්ම ඉදිකිරිම සඳහා 110545.38 ක මුදලකුත් පින්නදූව එල්.සී ද සිල්වා මාවත වංගු කොටස පළල් කිරීම සඳහා වරිපනම් අංක 51/01 දරණ ස්ථානයේ පැතිබැම්ම ඉදිකිරිම සඳහා 261110.54 ක මුදලකුත් හීගල්දූව පාර පැතිබැම්ම ඉදිකිරිම සඳහා 105246.45 ක මුදලකුත් මහ අම්බලන්ගොඩ නිවාස යෝජනා ක්‍රමයේ කාණු පද්ධතිය ඉදිකිරිම සඳහා 802334.28 ක මුදලකුත් කාය වර්ධන මධ්‍යස්ථානය හා ප්‍රජා ශාලා ගොඩනැගිල්ල ඉදිකිරීම I හා II අදියර සඳහා 1076123.03 ක මුදලකුත් හල්වතුර නිවාස යෝජනා ක්‍රමයේ 21 - 26 දක්වා නිවාස අසලින් යන පාර කොන්ක්‍රිට් කිරිම සඳහා 481128.94 ක මුදලකුත් වශයෙන් පසුගිය වසර තුල නගර සභා ප්‍රතිපාදන වශයෙන් නගරයේ බදු ගෙවන ජනතාවගේ මුදල් 11716327.17 ක මුදලක් වියදම් කරල තියෙනවා. ඒවගේම මානව සම්පත් සංවර්ධනය සඳහා සභා අරමුදලින් 2012 වර්ෂය සඳහා අභ්‍යාස පොත් බෙදා දීම. (මුදල් ගෙවීම 2013 වර්ෂය) 1227448.00 ක් පෙර පාසල් පොත් හා නිල ඇඳුම් බෙදා දීම සඳහා 120000.00 ක් පෙර පාසල් වාර්ෂික චාරිකා සඳහා 78000.00 ක් ජාතික කියවීමේ මාසය වෙනුවෙන් වැඩසටහන් ඉටු කිරීම සඳහා 180599.50 ක් ද විද්‍යුත් පුස්තකාලය සඳහා උපකරන මිලදී ගැනීම වෙනුවෙන් 1320676.00 ක මුදලක්ද ලෝක ළමා දිනය **(අනුග්‍රාහක භවතුන්ගේ මූල්‍ය දායකත්වයෙනි) වෙනුවෙන්** 608292.75 ක මුදලක්ද පෙර පාසල් වර්ෂ අවසාන විවිධ ප්‍රසංගය (මේ වන විට වියදම) සඳහා 8344.00 ක මුදලක්ද නගර ක්‍රීඩා (මේ වන විට වියදම) සඳහා 83660.00 ක් වශයෙන් මානව

සම්පත් සංවර්ධනය සඳහා **3627020.25** ක් අපි වියදම් දරල තියෙනවා. අද දින ඉදිරිපත් කරල තියෙන ලබන වසර සඳහා වන අයවැයෙහි පුනරාවර්තන ආදායම ලක්ෂ 200819900 ක් වශයෙනුත් ලබන වසර සඳහා වියදම ලක්ෂ 200808400 ක් ලෙසත් අතිරික්තය 11500 ක් ලෙසත් දක්වල තියෙනවා. මෙහිදී අපි අනික් අවුරුදු වලට සාපේක්ෂව නව වැඩසටහන් කිහිපයක් සිවි අවුරුදු සැළැස්ම යටතේ එකතු කරල තියෙනවා. සෑම ග්‍රාම නිලධාරී කොටසක් සඳහාම එහි සංවර්ධනය සඳහා ලක්ෂය බැගින් වෙන් කරල තියෙනවා. අපට මෙවැනි වැඩි කිරීම් කිරීමට ශක්තිය ලැබුනෙ රජයත් පළාත් සභාවත් අපට තියෙන නිසා. අපේ නගරයේ බදු ගෙවන ජනතාවට සතුටු විය හැකි ආකාරයේ පරිසරයක් අපි නිර්මාණය කරල තියෙනවා. මෙවර පොත් බෙදා දීමේදීත් අපි සඳහන් කරේ ඔබේ මුදල් ඔබ දෑතට කියලා. මෙහිදී මා සඳහන් කල යුතුයි වරිපනම් වශයෙන් ජනතාව ගෙවන මුදල වන්නෙ ලක්ෂ 70 යි. අපි වියදම් කරල තියෙනවා ලක්ෂ 117 ක්. ජනතාව සතුටු වෙන්න ඕනෙ තමන් ප්‍රාර්ථනා කරන ආකාරයෙන් නගර සභාව පැවතීම සම්බන්ධව. ජනතාවගේ සහභාගිත්වය 50% ක් නම් අපි රජය සහ නගර සභාව මගින් උත්පාදනය කර ගන්නා මාර්ග 50% ක් වෙනවා. 2014 අයවැය සඳහා ඔබ සියලු දෙනාම සහාය ලබා දේවි කියා මා බලාපොරොත්තු වෙනවා. මෙතෙක් ලබා දුන් සහයටත් අපි විශේෂයෙන්ම ස්තුති වන්ත වෙනවා.

මේ අයවැය සකස් කිරීම සඳහා සෑහෙන වෙහෙසක් ගත්තා ගමින් ගමට ගිහිල්ල රැස්වීම් තියල ජනතාවට අදහස් ප්‍රකාශ කරන්න දීල එවැනි කාර්යන් කරල සංවේදී අයවැයක් අපි පල කරල තියෙන්නෙ. ඒ සඳහා සහභාගි වුන සියලු මන්ත්‍රීවරුන්ටත් නිලධාරීන්ටත් මම ස්තුතිවන්ත වෙනවා. එවගේම මෙම කාර්යයේ සුවිශාල කාර්යභාරයක නියැලුන ගණකාධිකාරීතුමා , පොත් තබන මහත්මිය ඇතුලු සියලු දෙනාටමත් මගේ ස්තුතිය පුද කරමින් නිහඬ වෙනවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා කථා කරමින්,**</u>

සභාපතිතුමනි, 13 වෙනි පිටුවෙ සභාපතිවරුන්ගේ නාම ලේඛනය යටතේ අවසානයට තියෙන 1983 සිට 1984-04-27 තියෙන නම වැරදියි ඇස්. පී. එම්. ද සිල්වා කියල තියෙන්නේ. ඒක ඩබ්. පී. එම්. ද සිල්වා වෙන්න ඕනෙ.

<u>**ගරු සභාපති එම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,**</u>

පොත් තබන නිලධාරිණිය, එම වරද සංශෝධනය කරන්න.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා කථා කරමින්,**</u>

සභාපතිතුමනි නගර සභාවෙ අයවැය දිහා බලන කොට ආදායම 200819900.00 යි වියදම 200808400.00 යි අතිරික්තය 11500.00 යි. මෙහි සඳහන් සත්‍ය ආදායම් දිහා බලනකොට හැම වෙලාවෙම අඩු වෙලා තියෙනවා. වරිපනම් බදු හත්ලක්ෂයක් වගේ තිබුණා. සෑම ආදායමකම වගේම විශේෂයෙන් වරිපනම් බදු වල 3.8% ක් තමයි ආදායම පෙන්නල තිබුණෙ. වරිපනම් බදු ලක්ෂ 70 ක් විතර වෙනකොට ලක්ෂ හතලිස්ගානක් තමයි අය වෙලා තියෙන්නෙ. එවගේම කඩකුලී ලක්ෂ හතලිස්තුනක් පමණ වෙනවා. මේ කඩකුලී මෙපමණ ආවෙ අපේ කාලේ හදපු සාප්පු සංකීර්ණ වලින්. බස් නැවතුම් පොල, සතොස, පොල්වත්ත වෙළඳ සංකීර්ණය, පොදු වෙළඳ පොලේ ඉදිරිපිට ඇති කඩ මේවයින් තමයි අද ආදායම් ලැබෙන්නෙ. බදු ගෙවීම් තුල යම් යම් ඌනතාවයන් තියෙනවා. ඒ වගේම නගර සභාවෙ අනිවාර්යයෙන්ම කල යුතු වියදම් ලක්ෂ 20 ක් පමණ තියෙනවා. ඉන්ධන, දුරකථන ගාස්තු, විදුලිය, ජල ගාස්තු, ආරක්ෂක සේවය, තාවකාලික සේවකයන්ට ලක්ෂ 8 ක් විතර ගෙවනවා, අර්ථ සාධක තියෙනවා, නිලධාරීන්ගේ ගමන් වියදම්, ආදාහනාගාරෙට ගෑස් ගන්න ආදි වශයෙන් අනිවාර්යෙන්ම වියයුතු වියදම් දිහා බැලුවම ලක්ෂ 20 ක විතර ගානක් වෙනවා. ඊලගට මේ ඉදිරිපත් කරල තියෙන ආදායම්වල යම් අඩුවීමක් වෙනවා. රජය ඉදිරිපත් කල පහුගිය අයවැයේදි බදු අඩුවීමක් වුනා. එවගේම ඉන්දන ජලය වගේ දේවල් වැඩි වීමක් වෙන්නත් පුලුවන්. ඒනිසා මම හිතනවා මීට වඩා වියදම් වැඩි වීමක් මාසෙකට වෙන්න පුලුවන් මේ අයවැයෙහි. මම හිතනවා අනවශ්‍ය උත්සව ක්‍රීඩා අඩු කරල වියදම් පැත්තෙන් අඩු කරන්න සිද්ධ වෙයි මේක බැලන්ස් කරගෙන යන්න. මේ නගර සභාවෙ හුගක් කටයුතු කරේ රජයෙන් දීපු ආධාර සහ පළාත් සභාවෙන් දීපු ආධාර වලින්.

**<u>ගරු සභාපති එම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,</u>**

ලක්ෂ 117 ක මුදලක අපි නගර සභාවෙන් වැඩ කරල තියෙනවා. රජයෙන් දීල තියෙන්නෙ හතලිස්තුන් ලක්ෂ තිස්නම දාහයි. මේ වෙනකොට අපි මූල්‍ය පාලනයක් ඇතිකරගෙන තියෙනවා. අපි නගරයේ ජනතාවගෙ මුදල් ලක්ෂ 117 ක වැඩ කරල තියෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා කථා කරමින්,</u>**

සභාපතිතුමනි ඒවගේම මේ අයවැය ලේඛනයේ අවුරුදු ගානක් නොකෙරිච්ච වැඩ තියෙනවා. සංවර්ධන කටයුතු වෙලා තියෙනව කියල මම පිලිගන්නවා. මම කියන්නෙ ලැබීම් දිහා බලල සකසුරුවම් කමින් අවශ්‍යම දේ පමණක් කිරීමයි අවශ්‍ය වෙන්නෙ කියල. උදාහරණයක් විදියට කිව්වොත් මෙතන ජිම් එකක් හදනව තමුන්නාන්සේ. මේ අයවැයේ කොට්ඨාශ 12 තුල කිසිම ජිම් එකක් තිබුණෙ නැහැ. අද බැලුවොත් සිංහ ක්‍රීඩා සමාජෙ, රියෝ ක්‍රීඩා සමාජෙ ජිම් තියෙනවා. පුද්ගලික ඒවත් තියෙනවා. අපිට මීට වඩා තියෙනවා පාරවල්වල කාණුවල වැඩ. ඒවගේම පාරවල්වල ලයිට්කණු තියෙනවා අවුරුදු ගානක් වෙනවා. පාර පළල් කරන්න ජනතාව කැමැත්තෙන් ඉඩම් දීල ඒ ඉඩම් වල ලයිට් කණු ටෙලිෆෝන් කණු මාරුකර ගන්න බැරි තත්වයක් වෙලා තියෙනවා. ඒ ආයතන කලින් ගත්ත මුදලට දැන් ඒ වැඩේ කරන්නෙ නැහැ. ඒවගේම කාණු තියෙනවා පාරවල් තියෙනවා සංවර්ධනය කල යුතු. තමුන්නාන්සේ ඒව දිහා බලන්න ඕනෙ. නගරය ඇතුලත කාණු සුද්ධ කිරීම ඉතාම දුර්වලයි. මගෙ ප්‍රදේශයේත් එහෙමයි. මේ ලගදි පැය බාගයක් වැස්ස හිතපු නැති විදියට සේරම පාරවල් යටවුනා. මට මතකයි සරත් ශ්‍රීලාල් මන්ත්‍රීතුමා කිව්ව මහ පන්සල පිටුපසින් යන කාණුවේ වැටකෙයිය ගස් තියෙනවා කියලා. ඒව දිහා මෙතෙක්කල් කවුරුවත් බැලුවෙ නැහැ. නගරයේ එන වතුර බහින්නෙ එතනින් එතන හිරවුනහම ඒ අවට යට වුනා. මගෙ ගෙදර ඉස්සරහ කාණුවෙ පැල වැවිල. ටවුන් එකේ ගිහිල්ල බැලුවත් හැමෝම කියන්නෙ මේ කාණු සුද්ද වෙන්නෙ නැහැ කියලා. බදු ගෙවන ජනතාවට මේ තත්වය ඉතා බරපතලයි. ඒවගේම කුණු ඇදීමත් හරියට කෙරෙන්නෙ නැහැ. එවගේම මේ ජිම් එක හදන එකට වීථි සීමා හරිද කියල මිනිස්සු අපෙන් අහනව. මම කිව්ව එක සභාපතිතුමාගෙන් අහන්න කියලා. අපි සැලසුම් කමිටුවේ නැහැ. අපි ඉන්නෙ සභාවෙ කියලා. මෙතන අඩි 50 ඇතුලත කොන්ක්‍රීට් කරල තමයි මේක හදන්නෙ. අපේ බදු ගෙවන ජනතාව අඩි 50 තියල තමයි ගෙවල් හදල තියෙන්නෙ. සමූපකාරෙ ඉස්සරහම හදනව ගොඩනැගිල්ලක් අඩි 50 තියලා. සමූපකාරෙ තාප්පෙටම තියල හැදුව ගරාජ් එකක්. මොනවද මේ නීතිය. තමුන්නාන්සේගෙ මල්ලි කතා කරා ඒ ගැන. මේක සමුපකාර මන්දිරයක්ද ගරාජ් එකක්ද කියලා. තමුන්නාන්සේලා ඇයි මේවට පියවර ගන්නෙ නැත්තෙ කියලයි මම අහන්නෙ.

**<u>ගරු සභාපති එම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,</u>**

අපි ඒව දැනුම් දීල තියෙන්නෙ විපක්ෂනායක තුමා. ඉදිරියේදි නිවැරදි කරාවි. ඒ ආයතනයත් රාජ්‍ය ආයතනයක්. ඒ නිසා එක නිවැරදි කරාවි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා කථා කරමින්,</u>**

සභාපතිතුමනි මේ තැන් මහජනතාවගෙ ඇහැට හොඳට වැදෙන තැන්. අද සාමාන්‍ය කෙනෙක් ඔතන ගෙයක් හදන්න ගියොත් වීථිරේඛා බලනවනෙ. එකයි මම කියන්නෙ මේව හොඳට කල්පනාවෙන් කරන්න.

**<u>ගරු සභාපති එම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,</u>**

තව මාස දෙක තුනක් යනකොට ඔය ප්‍රශ්නෙ විසඳෙනව.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා කථා කරමින්,</u>**

ආදායම් ආධාර 28.3 ක් තිබුණ. ඒවගේම 2013 සත්‍ය ආදායම තිබුනෙ 10315200 වගෙ ගානක් තිබුණ. ඌනතාවයක් තිබුන 5343000 ක. වියදම ගිහිල්ල තියෙනව 108502000 ක් විතර. මම කියන්නෙ අපි කොහොම කතා කරත් මම මේවට දැම්මෙ නැහැ අපි ගත්ත ණය මුදල් තියෙනව. තව පඩිනඩි වලට තියෙනවා. මම සාමාන්‍යයෙන් නගර සභාවෙ විය යුතු වියදම්ම ටිකක් තමයි මම තමුන්නාන්සේට වියදම් කරේ. අනිවාර්යෙන්ම කල යුතු ලක්ෂ 20 ක විතර වැඩ කොටසක් තියෙනවා. මම තමුන්නාන්සේට කියනවා පුරවැසි ප්‍රඥප්තිය කියල බෝඩ් එකක් තියෙනවා. මිනිස්සු වැඩක් කරගන්න ආවහම මේක බලල කියනව මිනිත්තු තිහෙන්

පැය බාගෙන් කරන එව කොහොමද කරන්නෙ කියලා. අපි වැඩක් කර ගන්න මෙච්චර කල් ආව. අරක නැතෙයි කියනව මේක නැතෙයි කියනව.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කථා කරමින්,</u>**

වැඩ ප්‍රමාද වෙන්නෙ නම් නැහැ. මට පේනවනෙ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා කථා කරමින්,</u>**

ඔබතුමා එහෙම කිව්වට ජනතාවනෙ අපට කියන්නෙ. තමුන්නාන්සෙ ඉන්න වෙලාවට කරනව ඇති. නමුත් නියම කරල තියෙන වෙලාවට මේක ජනතාවට වෙන්නෙ නැහැයි කියල මම කියනව. එක තමුන්නාන්සෙල පිලිගන්න ඕනෙ. මේ කමිටු පවත්වල ජනතාව ගෙන්නල අඩුපාඩු පෙන්නල තියෙනවා. එව ප්‍රමුඛතාවය දිය යුතු විදියට කරන්න කියල මම ඉල්ලා සිටිනවා. කොහොම වුනත් ඔබතුමාල අපේ වැඩ කරනකොට පාරක් උනත් විසි කැත්තෙන් ගහල නිකම්ම තියනවා. අනිත් තැන් හොඳට සුද්ධ කරනවා. එවගේම මම කිවුව මහ පන්සල පාර පැච් කරන්නවත් කියලා. තමුන්නාන්සේ ගියොත් පෙනේවි. නගරයෙන් එන විශාල වතුර පාරක් එතනින් එනවා. පාර උඩින් තමයි මේ වතුර පාර යන්නෙ. එනිසා මම කියන්නෙ වැඩ කරනකොට කොට්ඨාශයකට එකක්වත් කරගෙන යන්න. තමුන්නාන්සේලා වැඩ කරද්දි අපිව අහකට දාල වැඩ කරන්නෙ. මම තමුන්නාන්සේට කියනව ධම්මානන්ද මාවතේ අතුල මහත්තයගේ ගෙයි ගාව බලන්න කියල. අපි අවුරුදු ගානක් කියවා එතන හදන්න කියලා. තමුන්නාන්සෙ නිලධාරියෙක් යවල බලන්න මෙතන තත්වෙ මොකක්ද කියලා.

**<u>ගරු සභාපති එම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,</u>**

පුද්ගලයෙක්ගෙ තාප්පෙ පිළිබඳ වගකීම නගර සභාවට නැහැ. අනතුරුදායක තත්වෙ තියෙනව නම් අපි එයාට දැනුම්දීල හදන්න ඕනෙ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා කථා කරමින්,</u>**

එතන අනතුරක් වෙන්නෙ පාරෙ යන කෙනෙකුටනෙ. තමුන්නාන්සේලාට ඒ වෙලාවට තේරේවි. මේක අවුරුදු ගානක් අයවැය ලේඛනයේ තියෙනවා. නමුත් මේක තාම වුනේ නැහැ. ඔය කොච්චර කතා කරත් තමුන්නාන්සෙගෙ හිත දන්නව නගර සභාවෙ මුදල් වල තත්වය. නගර සභාවෙ ආදායම නිසි පරිදි ලැබෙන්නෙ නැති වුනහම වියදම වැඩි වුනහම කොහොම කිව්වත් පළාත් සභාවකින් හරි ආණ්ඩුවෙන් හරි දෙන ආධාර නැති වුනොත් හුගක් වෙලාවට මේ වැඩ කරගෙන යන්න අමාරුයි කියල මම කියනවා. මේ සඳහා දායක වුන හිටපු ලේකම් මහත්මයාත් දැනට සිටින ලේකම් මහත්මයාත් විශේෂයෙන්ම ගණකාධිකාරී මහත්මයත් පොත් තබන නිලධාරිණියත් ඇතුලු සියලුම නිලධාරීන් එකතු වෙලා අයවැයක් ඉදිරිපත් කිරීම සම්බන්ධව මම සෑම දෙනාටම ස්තුතිවන්ත වෙනවා. එවගේම ස්වේච්ඡාවෙන් පැමිණිලා මේ සඳහා සහාය ලබා දුන් කමිටු වල සිමාජික මහත්මාවන්ටත් ස්තුතිවන්ත වෙමින් නගර සභාවේ කටයුතු කිරීමේදී අපේ වැඩ කටයුතු වලටත් සහයෝගයක් ලබා දෙන්නයි ඉල්ලමින් මම නිහඬ වෙනවා.

**<u>ගරු සභාපති එම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,</u>**

අපි විලේගොඩ කොට්ඨාශෙ රැස්වීම තිබ්බෙ ජයන්ත මන්ත්‍රීතුමා මුලසුනේ තියාගෙන. ඔබතුමා ඔය කියපු යෝජනාව ලැයිස්තු ගත කරල තියෙන්නෙ 11 වෙනියට. ලැයිස්තුගත කරන කොට ඔබතුමාලට කිව්ව පළවෙනියට කරන්නෙ මොකක්ද දෙවනියට මොකක්ද කියල පෙල ගස්වන්නයි කියල. ඔබතුමා 11 වෙනියට නම් කරපු එක තමයි ඔබතුමා ප්‍රමුඛතාවය දෙන්නයි කියන්නෙ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ. ජී. ලක්ෂ්මි හේමන්තා ද සිල්වා මෙනවිය කථා කරමින්,</u>**

සභාපතිතුමනි විපක්ෂනායකතුමා කිව්ව එතුමන්ලට අපි කිසිම දෙයක් කරලත් නෑ කෙරෙන්නෙත් නෑ කියල. ඇත්තටම මම මුලින්ම මේ නගර සභාවට ඇවිල්ල මගෙ ප්‍රතිපාදන වලින් හීගල්දුව පාර කරෙ. එනිසා විපක්ෂනායකතුමා එහෙම කියන්න එපා. අපි දෙයක් කරන්න ඇවිල්ල ඉන්නෙ. මේ පාරෙ යන්නෙ එක්සත් ජාතික පක්ෂෙ අයයි මේපාරෙ යන්නෙ පොදු පෙරමුනේ අයයි කියල නෙමෙයි මමනම් සත් භාවයෙන් තමයි හදපු පාරවල් සියලු දේම හදල තියෙන්නෙ සභාපතිතුමනි. මම දන්නව ඒ පාරෙ ජයන්ත මහත්තයගෙ ඡන්ද තමයි ඔක්කොම තියෙන්නෙ. මම තිලක් කුසුම්සිරි මහත්තයගෙ ගෙදර ලග ඒ තාප්පෙ බැඳල දෙන්නත් ඇස්තමේන්තුවක් හදල

තියෙන්නෙ. ඒම හත්මය දැන් දෙන්නෙ නැහැ. තාප්පෙ දැන් ඇලවෙලා. මෙතනදි අපි වැඩ කරේ පක්‍ෂය බලල නෙමෙයි සභාපතිතුමා. මම ඉදිරියටත් වැඩ කරන්නෙ එහෙමයි. විපක්‍ෂනායකතුමා අයවැයට කියන්න දෙයක් නැති නිසා මෙහෙම කියනවද මම දන්නෑ. මම නම් හොඳම අයවැයක් ලෙස දකිනවා සභාපතිතුමා. ඉදිරියටත් අපිට හොඳින් අපේ කටයුතු කරගෙන යාමට හැකියාව ලැබේවි. සියලු දෙනාට ස්තුතිවන්ත වෙමින් සුබ නව වසරක් වේවායි ප්‍රාර්ථනා කරමින් නිහඬ වෙනවා. ස්තුතියි.

**<u>ගරු සභාපති එම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,</u>**

2014 අයවැය සම්බන්ධයෙන් මම මේ අවස්ථාවේදී ඡන්දය විමසනවා.

<u>තීරණය</u>

☞ **2014 අයවැය සම්බන්ධයෙන් ඡන්දය විමසනු ලදුව ගරු සභාපති එම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා, ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා, ගරු නගර සභා මන්ත්‍රී ඒ. පී. ලක්‍ෂමි හේමන්තා ද සිල්වා මෙනවිය, ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා, ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා, ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරම්ණියගේ මහතා, ගරු නගර සභා මන්ත්‍රී ඒ. ඩබ්. ජගත් කුමාර මහතා යන අය පක්‍ෂව ඡන්දය ප්‍රකාශ කර අතර , ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා, ගරු නගර සභා මන්ත්‍රී කේ. එම්. චන්ද්‍රසිරි මහතා, ගරු නගර සභා මන්ත්‍රී බී. ජනිත් වික්‍රමතිලක මහතා විපක්‍ෂව ඡන්දය ප්‍රකාශ කර අතර ගරු නගර සභා මන්ත්‍රී ආර්. එම්. දේවි රොහාන් ද සිල්වා මහතා ඡන්දය දීමෙන් වැලකී සිටින ලදී. ඒ අනුව වැඩි ඡන්ද 4 කින් 2014 අය වැය සභා සම්මත විය.**

**පෙ. ව. 10.55 ට පමණ සභාවේ වැඩ කටයුතු අවසන් කරන ලදී.**

| | |
|---|---|
| එස්. ඩී. රාමනායක, | ඇම්. ඩබ්. අරුණ ප්‍රදීප්, |
| ප්‍රධාන කළමනාකරණ සහකාර, | සභාපති, |
| අම්බලන්ගොඩ නගර සභාව. | අම්බලන්ගොඩ නගර සභාව. |

**2014 – 01 – 01 දින,**
**අම්බලන්ගොඩ නගර සභා කාර්යාලයේදීය.**